# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

## අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය (III කොටස) - දෙවන සෙමෙස්තරය - 2018

## SAE 410 - අධ්‍යාපනයේ විශේෂ ක්ෂේත්‍ර

**පැය තුනයි (03)**

**පිළිතුරු සැපයීම සඳහා කොටස් දෙකක් පමණක් තෝරාගන්න. එක් එක් කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව තෝරාගත් තවත් ප්‍රශ්න දෙකක් ඇතුළත් වන සේ කොටස් දෙකින් ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.**

---

| | | |
|---|---|---|
| I කොටස | - | අධ්‍යාපන සමාජ විද්‍යාව |
| II කොටස | - | අධ්‍යාපනික තාක්ෂණය |
| III කොටස | - | අධ්‍යාපන සැලසුම්කරණය |
| IV කොටස | - | බෞද්ධ අධ්‍යාපනය |
| V කොටස | - | අධ්‍යාපන නීතිය |
| VI කොටස | - | පූර්ව ළමාවිය අධ්‍යාපනය |
| VII කොටස | - | අධ්‍යාපන මාර්ගෝපදේශනය හා උපදේශනය |

### I කොටස - අධ්‍යාපන සමාජ විද්‍යාව

1. පහත සඳහන් කොටස්වලට කෙටි නිශ්චිත පිළිතුරු සපයන්න.

   i. අධ්‍යාපන සමාජ විද්‍යාව හැදෑරීම ගුරු භූමිකාවට වැදගත්වන ආකාරය හඳුන්වන්න.

   ii. පාසල් ප්‍රජාව හැඳින්වීම සඳහා යොදාගෙන ඇති සංකල්ප හතරක් පෙන්වා දෙන්න.

   iii. විස්තරාත්මක පර්යේෂණ වර්ග හතරක් නම් කරන්න.

   iv. සමාජානුයෝජනයේ අවශ්‍යතා හතරක් හඳුන්වන්න. (ලකුණු 5x4=20)

2. i. අතීතයේ සිට පාසල ප්‍රජාවේ අවයවයක් ලෙස සැලකීමට මුල් වූ හේතු පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. පාසලේ හා ප්‍රජාවේ සංවර්ධනය සඳහා පාසල් ප්‍රජා සම්බන්ධතා පැවතිය යුතු ආකාරය විග්‍රහ කරන්න. (ලකුණු 8)

3. i. සමාජ විද්‍යා පර්යේෂණ හා විද්‍යාත්මක ක්‍රමය අතර සම්බන්ධය පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් සැලසුම් කිරීමේදී සැලකිය යුතු සමාජීය සාධක විස්තර කරන්න. (ලකුණු 8)

4. i. සමාජානුයෝජනය හා අධ්‍යාපනය අතර ඇති සම්බන්ධතාව විග්‍රහ කරන්න. (ලකුණු 7)

ii. පුද්ගලයෙක් සමාජානුයෝජනය වන ආකාරය හා එයට යොදා ගැනෙන ශිල්ප ක්‍රම පැහැදිලි කරන්න. (ලකුණු 8)

5. i. පාසලක් තුළින් සමාජානුයෝජනය සිදුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. පවුලේ ව්‍යුහය සමාජානුයෝජනයට යහපත් හා අයහපත් අන්දමට බලපාන ආකාරය විස්තර කරන්න. (ලකුණු 8)

## II කොටස - අධ්‍යාපනික තාක්ෂණය

1. i. එල්ටන්ගේ ආකෘතිය (Elton's Model) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

ii. ජනගහන අධ්‍යාපනඥයින් විසින් හඳුන්වන 'ජනගහන පිපිරීම' නූතන අධ්‍යාපන ක්ෂේත්‍රයට අභියෝගයක් වන්නේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 3)

iii. ජනගහන පිපිරීමට අමතරව අධ්‍යාපන ක්ෂේත්‍රයට එල්ල වූ නවත් අභියෝග දෙකක් නම් කරන්න.

(ලකුණු 2)

iv. අධ්‍යාපන තාක්ෂණය පිළිබඳව අන්තර්ජාතික කොමිසමක් විසන් ඉදිරිපත් කළ පිළිගත් නිර්වචනයක් ලියන්න.

(ලකුණු 3)

v. මතු වූ අභියෝග හමුවේ අධ්‍යාපනයේ සංවර්ධනයක් අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාව අනුගමනය කළ ක්‍රියාමාර්ග පහක් ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 5)

vi. අධ්‍යාපනික තාක්ෂණයේ දෘඩාංග මෘදුකාංග හා ජීවාංග සඳහා නිදසුනක් මගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 3)

2. i. ප්‍රක්ෂේප නොකරන වර්ගයේ දෘෂ්‍යාධාරකවල ප්‍රක්ෂේප කරන වර්ගයට සාපේක්ෂව ඇති ප්‍රබලතා පහක් නම් කරන්න. (ලකුණු 5)

ii. කළු ලැල්ලේ වැඩ කාර්යක්ෂම වීම සඳහා වැදගත්වන කරුණු පහක් විස්තර කරන්න. (ලකුණු 5)

iii. නවක ගුරුවරයෙකුට පාඩමක් ඉගැන්වීමේ දී තාක්ෂණික ලෙස කළුලැල්ල පරිහරණය කිරීම සම්බන්ධව යෝජනා ඉදිරිපත් කරන්න.

(ලකුණු 5)

3. i. අධ්‍යාපනික රූපවාහිනියටත්, අධ්‍යාපනික ගුවන් විදුලියටත් පොදු වූ ලක්ෂණ පහක් විස්තර කරන්න. (ලකුණු 5)

ii. වාර්තාගත කළ අධ්‍යාපනික ගුවන්විදුලි පාඩමක් ඇසුරෙන් සිදු කරන පන්ති කාමර ඉගැන්වීමක දී ගුරුවරයාගේ භූමිකාව පැහැදිලි කරන්න.

(ලකුණු 5)

iii. ඉගැන්වීම සඳහා රූපවාහිනී මාධ්‍යය යොදාගැනීමේදී ඇතිවන ඌනතා සඳහන් කර එම ඌනතා පූරණය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සඳහන් කරන්න.

(ලකුණු 5)

4. i. 'දූරස්ථ අධ්‍යාපන' සම්මුඛ අධ්‍යාපනයෙන් වෙනස්වන ආකාර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

ii. දූරස්ථ අධ්‍යාපන මගින් අධ්‍යාපනික ක්ෂේත්‍රයට ලැබෙන වාසි පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 5)

iii. අධ්‍යාපනික ක්ෂේත්‍රය තුළ දූරස්ථ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටලු මග හරවා ගැනීමට අධ්‍යාපනික තාක්ෂණයෙන් ලද හැකි පිටිවහල විග්‍රහ කරන්න.

(ලකුණු 5)

5. i. භාෂා විද්‍යාගාරයක ක්‍රියාකාරිත්වය පිළිබඳව පැහැදිලි කරන්න.

(ලකුණු 5)

ii. භාෂා විද්‍යාගාර තාක්ෂණය ඔස්සේ ද්විතියක භාෂාවක් වන ඉංග්‍රීසි ඉගැන්වීමේ දී ලැබිය හැකි සුවිශේෂ වාසි කවරේද? (ලකුණු 10)

## III - අධ්‍යාපන සැලසුම්කරණය

i. අධ්‍යාපන සැලසුම්කරණය යන්න පිළිගත් නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. සාර්ව හා සූක්ෂම සැලසුම්කරණය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 4)

iii. පාසල් සිතියම්කරණයේ අරමුණු 4 ක් නම් කරන්න. (ලකුණු 4)

iv. අධ්‍යාපන සැලසුම්කරණයේදී නියාමනයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. අධ්‍යාපන සැලසුම්කරණ ක්‍රියාවලිය සඳහා නවීන තාක්ෂණික උපක්‍රම යොදාගත හැකි අවස්ථා 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4)

(මුළු ලකුණු 4x5= 20)

2. i. පාසලක තොරතුරු අනාවරණය කරගැනීම සඳහා යොදාගත හැකි උපායමාර්ග දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. පාසල් මට්ටමේ සැලසුම්කරණය සඳහා සැලකිල්ලට ගතයුතු යැයි නිර්දේශ කර ඇති ක්ෂේත්‍රවලින් පහක් නම් කරන්න. (ලකුණු 5)

iii. පාසල් සැලසුම්කරණය සඳහා අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 6)

(මුළු ලකුණු 15)

3. i. අධ්‍යාපන සැලසුම්කරණයේ දී සැලකිලිමත් විය යුතු සංකල්ප ලෙස අභ්‍යන්තර කාර්යක්ෂමතාව සහ බාහිර කාර්යක්ෂමතාව පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. අභ්‍යන්තර කාර්යක්ෂමතාව හා බාහිර කාර්යක්ෂමතාව මිනුම් කළ හැකි ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 5)

iii. "ශ්‍රී ලාංකික අධ්‍යාපන පද්ධතිය තුළ අධ්‍යාපන නාස්තිය සිදුවේ" යන්න උදාහරණ ඇසුරින් සනාථ කරන්න. (ලකුණු 15)

(මුළු ලකුණු 15)

4. i. උපායමාර්ගික සැලසුම්කරණය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 4)

ii. පාසලක විදුහල්පතිවරයකු ලෙස ඔබ හඳුනාගත් ගැටලුවක් අනාවරණය කර ගැනීම සඳහා "ගැටලු ගස" ප්‍රයෝජනයට ගත හැකි ආකාරය උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 5)

iii. උපායමාර්ගික සැලසුම්කරණයේ ප්‍රධලකං උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.
(ලකුණු 6)

(මුළු ලකුණු 15)

5. i. අධ්‍යාපන සැලසුම්කරණය හා සම්බන්ධ සමාජ ඉල්ලුම් ප්‍රවේශය හා මිනිස්බල ප්‍රවේශය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. මිනිස්බල ප්‍රවේශයට අනුව අධ්‍යාපනය සැලසුම් කිරීමේ දී ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

(මුළු ලකුණු 15)

## IV කොටස - බෞද්ධ අධ්‍යාපනය

1. i. "බුද්ධධර්ම දර්ශනයකි" මෙම ප්‍රකාශය සනාථ කිරීමට හේතු හතරක් ඉදිරිපත් කරන්න.

ii. බෞද්ධ අධ්‍යාපනයෙහි අරමුණු හතරක් ලියන්න.

iii. මහා මංගල සූත්‍රයෙහි සඳහන් එක් මංගල කරුණක පරමාර්ථ සත්‍ය අදහස පැහැදිලි කරන්න.

iv. මූලික බුද්ධධර්මයෙහි සඳහන් ආචාරවිද්‍යාත්මක සංකල්ප දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

v. දුක්ඛ සමුදයාර්ථ සත්‍යය යටතේ දක්වා ඇති තෘෂ්ණාවේ ස්වභාව දෙකක් ලියන්න.

(ලකුණු 4x5 =20)

2. i. බෞද්ධ අධ්‍යාපන පදනම සකස් වීමට බලපෑ සාධක විස්තර කරන්න.

(ලකුණු 7)

ii. බෞද්ධ "අධ්‍යාපන සංකල්පය" පැහැදිලි කරන්න. (ලකුණු 8)

3. i. දහම් පාසල් අධ්‍යාපනය ස්ථාපිත කිරීමේ අභිමතාර්ථ පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. එම අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට ඇති අභියෝග පෙන්වා දී එම අභියෝග අවම කරලීමට ගත හැකි යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 8)

4. i. මුල් බුදුසමයේ සඳහන් ආචාරධර්ම ඉගැන්වීම් පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. සදාචාරාත්මක ක්‍රියා කළ යුත්තේ ඇයි? යන්න සනාථ කිරීමට හේතු ඉදිරිපත් කරන්න. (ලකුණු 8)

5. පහත සඳහන් තේමා අතුරින් තුනක් තෝරාගෙන ඒවායෙහි අධ්‍යාපනික වැදගත්කම පිළිබඳ ඇගයීමක් කරන්න.

අ. මහා මංගල සූත්‍රය (ලකුණු 5)

ආ. කරණීය මෙත්ත සූත්‍රය (ලකුණු 5)

ඉ. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය (ලකුණු 5)

ඊ. චතුරාර්ය සත්‍ය ඉගැන්වීම (ලකුණු 5)

උ. බෞද්ධ පුනර්භව සංකල්පය (ලකුණු 5)

## V කොටස - අධ්‍යාපන නීතිය

1. ඔබ හදාරා ඇති අණපනත්, ව්‍යවස්ථා සංග්‍රහ, ආයතන සංග්‍රහය හා චක්‍ර ලේඛ ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිද්ධි අධ්‍යයනය

පහත දැක්වෙන සිද්ධි අධ්‍යයනය කියවා එය යටතේ ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පහත දැක්වෙන්නේ එක්තරා විනය පරීක්ෂණයකදී විනය නිලධරින් ඉදිරියෙහි ශිෂ්‍යයකු විසින් දෙන ලද සාක්ෂියකි.

අපේ පායලේ ගුරු මහත්මයකු හදිසි අසනීපයකින් නැතිඋනා. එම අවමගුලට සහභාගිවීමට ඉස්කෝලේ සියලුම ළමයින්ට ප්‍රින්සිපල් මැඩම් නියෝගයක් දුන්නා. පාසල් වෙලාවෙම උදේ 10 ට යන්න ලැස්තිවෙන්න කීවා ලැස්ති උනා අපේ පන්තියේ ඔක්කොම ළමයි පිට්ටනියට පෙළගැසුනා. සහභාගි නොවන ළමයි කවුද බලන්න ප්‍රින්සිපල්මැඩම් පංතියක් ගානෙ ඇවිදගෙන ගියා. අපේ පංතියටත් ආවා. එවෙලෙ පංතියෙ ඉතුරුවෙලා හිටියෙ මමයි. සුනිලුත් විතරයි. මං කලුවරට හරිම බයයි. යක්ෂ දිස්ටියක් මට තියනවා කියලා සාස්තර කියන මාමා අම්මට කියල මං මළ ගෙවල්වල යන්නත් හරිම බයයි. රෑට හීනෙන් පේනවා. මේ නිසා මට යන්තරයක් දාලා තියෙන්නේ. මළ ගෙදර ගිහින් කිල්ලට අහුකර ගන්නා එපා කියලා කියල. තියෙන්නේ. ඉතින් මම මළ ගෙදර යන්නෙ නැතිව පංතියට වෙලා හිටියෙ. ප්‍රින්සිපල් මැඩම් මං ඉන්නව දැකල බැණල ගහන්න පටන් ගත්තා වේවැලෙන්. මමත් දිව්වා ගහනකොට. පන්නා ගෙන ආවා. පස්සෙන්ම. යන්න තැනත් තිබුනෙ නැහැ. ඒ නිසා පළමු තට්ටුවෙන් බිමට පැන්නා මං. කුවාල වෙලා බිම වැටිලා හිටියා. මට නැගිටින්න බැරුව. ප්‍රින්සිපල් මැඩම් මං වැටිල හිටපු තැනටත් ලීයක් අරගෙන ඇවිත් ගැහුවා. ගුරුවරුන් මාව ඉස්පිරිතාලෙට ගෙනාවා.

i. විදුහල්පතිවරිය විසින් උල්ලංඝනය කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශයට පමණක් අදාළ නීතිය කුමක්දැයි නම් කරන්න.

(ලකුණු 5)

ii. විදුහල්පතිනිය කඩකර ඇති සිවිල් නීතිය කුමක්ද? (ලකුණු 5)

iii. ශිෂ්‍යයාගේ පර්ෂවයෙන් කඩ වී ඇති නීතිය දක්වන්න. (ලකුණු 5)

iv. විදුහල්පතිනියට විරුද්ධව විනය පරීක්ෂණ දෙකක් සිදුකලහැකිය එම පරීක්ෂණ දෙක දක්වන්න. (ලකුණු 5)

2. i. ගුරුවරයකුගේ පෞද්ගලික ලිපිගොනුවට දෙපාර්තමේන්තුවෙන් එකතුකරන ලිපි හතරක් දක්වන්න.

(ලකුණු 7)

ii. පෞද්ගලික ලිපිගොනුවට ගුරුවරයා ලබා දිය යුතු ලේඛන හතරක් දක්වන්න.

(ලකුණු 8)

3. අධ්‍යාපන නීතිය අධ්‍යාපනයෙහි නියැලෙන වෘත්තිකයෙකුට වැදගත්වන ආකාරය දක්වන්න. (ලකුණු 15)

4. i. ගුරුවරයකු සතු වරප්‍රසාද පැහැදිලි කර වරප්‍රසාද පහක් දක්වන්න.

(ලකුණු 8)

ii. ගුරුවරයකු සතු දේශපාලන අයිතිය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 7)

5. i. ආයතන සංග්‍රහය අනුව අවිනය යනු කුමක්ද? (ලකුණු 8)

ii. නිවාඩු ලබා ගැනීමේ දී අවදානම් සාධක යන්න කෙටියෙන් දක්වා අවදානම් සාධක පහක් නම් කරන්න. (ලකුණු 7)

## VI - පූර්ව ළමාවිය අධ්‍යාපනය

පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටමත් දෙවන කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

i. නවජ දරුවා දක්වන ප්‍රතීක ක්‍රියා 4 ක් නම් කරන්න.
ii. මුල් ළමාවිය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
iii. මුල් ළමාවිය දරුවාගේ වාග්මාලාව බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
iv. වර්ධනය හා සංවර්ධනය අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

v. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක තිබිය යුතු ප්‍රමිති 4 ක් ලියන්න.

vi. සිව් වැදෑරුම් භාෂා කාර්යයන් අතුරින් මුල් ළමාවිය තුළදී සංවර්ධනය කළ යුතු කාර්යයන් මොනවාද?

vii. "ස්ව සංකල්පය" නිර්වචනය කරන්න.

viii. දරුවාගේ සංවර්ධනය අඩාල විය හැකි කරුණු හතරක් ලියන්න.

ix. පෙර පාසල් විෂයමාලාවට අන්තර්ගත විය යුතු මූලික කරුණු 4 ක් ලියන්න.

x. මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධයෙන් ලංකාව තුළ ක්‍රියාත්මක වැඩ සටහන් නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

2. i. මුල් ළමාවිය සංවර්ධනයේ මූලික කරුණු 04 ක් පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. මුල් ළමාවිය දරුවාගේ මූලික අවශ්‍යතා ඉටු නොවීම එම දරුවාගේ සංවර්ධනයට බලපාන ආකාරය උදාහරණ සහිතව විමසන්න.

(ලකුණු 8)

3. i. පූර්ව ප්‍රසව පරිසරය දරුවාගේ සංවර්ධනයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. කායික, ප්‍රජානන හා සමාජ චිත්තවේග සංවර්ධනය පෙර පාසල් අධ්‍යාපනයට උදව්වන ආකාරය උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 8)

4. i. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමේදී සැලකිලිමත් විය යුතු කරුණු විස්තර කරන්න. (ලකුණු 7)

ii. ශ්‍රී ලංකාව තුළ මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධයෙන් පවත්නා ගැටළු හා බාධක මඟහැර ගැනීම උදෙසා පිළියම් යෝජනා කරන්න.

(ලකුණු 8)

5. i. පෙර පාසල් ගුරුවරිය විසින් ඉගෙනුම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ලකුණු 7)

ii. ඔබ නැරඹූ **"Children of heaven"** සහ **"Stanley Ka Dabba"** යන චිත්‍රපට දෙක අතරින් එකක් තෝරා ගෙන පූර්ව ළමාවිය සංවර්ධනයට එම චිත්‍රපටයෙන් ලබාදෙන දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුනු 8)

## VII කොටස - අධ්‍යාපන මාර්ගෝපදේශනය සහ උපදේශනය

1. i. උපදේශන සැසිවාරයක් සඳහා සේවාලාභියා පිළිගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් නම් කරන්න.

ii. වක්‍ර ලෙස නිහඬතාව බිදීම සඳහා උදාහරණයක් සඳහන් කරන්න.

iii. ලුහුඩුකරණය අර්ථ දක්වන්න.

vi. උපදේශන සැසියකදී සාරාංශකරණය සිදුකළ හැකි අවස්ථා 2ක් සඳහන් කරන්න.

v. උපදේශනයේ දී විවෘත ප්‍රශ්න ඇසීමේ වාසි දෙකක් සඳහන් කරන්න.

vi. කණ්ඩායම් උපදේශනය යනු කුමක්ද?

vii. උපදේශන ක්‍රියාවලිය තුළ දී සරල සංයම අභ්‍යාස වැදගත් වන්නේ ඇයි? කෙටියෙන් පැහැදිලි කරන්න.

viii. උපදේශනයේදී පසු විපරම් කිරීමේ අරමුණු 2 ක් සඳහන් කරන්න.

ix. සේවාලාභියකුගේ ගැටලුවක් විශ්ලේෂණයේ දී අවධානය යොමුකළ යුතු කරුණු 2 ක් සඳහන් කරන්න.

x. උපදේශකවරයා උපදේශන සැසියක් සඳහා සූදානම් වීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 2 ක් සඳහන් කරන්න.

**(2x10 = 20 ලකුණු)**

2. i. උපදේශන සැසියක සාර්ථකත්වය සඳහා ප්‍රාරම්භක කුසලතාවල වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. සේවාලාභියකු සමඟ සුහද අන්තර් සබඳතාවක් ගොඩ නගා ගැනීම සඳහා සක්‍රිය සවන්දීම වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 8)

3. i. පහත සඳහන් සිද්ධි අධ්‍යයනය කර, එක් එක් ප්‍රකාශ සඳහා ලුහුඬුකරණ වාක්‍ය එක බැගින් සඳහන් කරන්න.

අ) "මම මගේ දෙමාපියන්ට වෛර කරනව. ඔවුන් මට ආදරේ නෑ. මගේ මල්ලි නිතරම මාත් එක්ක රණ්ඩු කරනව. ඒත් දෙමාපියො එයාට බනින්නේ නෑ. මට තමයි බනින්නේ. ඒ ගොල්ලො ගොඩක් දේවල් මල්ලිට ගේනව. අපිට සලකන්නෙ දෙවිදියකට. දැන් මට ජීවිතේ එපාවෙලා. මම මල්ලිටත් වෛර කරනව."

ඇ. "මට සුදුසු රැකියාවක් තෝරා ගන්න බැරි උනා. මම එක තැනකින් තව තැනකට යනව. ඒක මට ඇත්තටම අපහසු වැඩක්. ඒත් මට එක තැනක වැඩි කාලයක් රැඳිල ඉන්න බෑ" (ලකුණු 7)

ii. උපදේශනයේ දී සහකම්පනය ලබාදිය හැකි ආකාර උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 8)

4. i. පාසල් සිසුන් සඳහා භාවිත කළ හැකි වෘත්තීය උපදේශන ක්‍රමශිල්ප උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා සුදානම් වන සිසුන් සඳහා ලබාදිය හැකි අධ්‍යාපනික උපදේශන ක්‍රම ශිල්ප 4 ක් උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

5. i, පාසල් උපදේශකවරයකුට භාවිත කළ හැකි කණ්ඩායම් උපදේශන වර්ග 4 ක් පැහැදිලි කරන්න. (ලකුණු 8)

ii. උපදේශන සැසිවාරයන්හිදී "පර්යන්තය" සිදුකළ හැකි ආකාර උදාහරණ ඇසුරින් දක්වන්න. (ලකුණු 7)

o•o•o•o•o•o•o•o•o•